# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023**
**2025 අගෝස්තු**
**මානවශාස්ත්‍ර පීඨය**

## නාට්‍ය හා රංගකලාව
**(නව නිර්දේශය)**

**ශ්‍රී ලංකාවේ යාතු කර්ම සහ ගැමි නාට්‍ය - DMAT 18224**

ප්‍රශ්න **පහකට** (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අ) සමකාලීන සමාජය වෙත දැනුම සන්නිවේදනය කිරීම සඳහා කොහොඹා යක් කංකාරියේ යොදාගෙන ඇති නාට්‍යමය උපක්‍රම උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 20)

නැතහොත්

ආ) සමකාලීන සමාජය වෙත දැනුම සන්නිවේදනය කිරීම සඳහා රටයකුම ශාන්තිකර්මකරුවා යොදාගෙන ඇති නාට්‍යමය උපක්‍රම උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 20)

02. ප්‍රාසාංගික ගුණය ඉස්මතු කරමින් හාස්‍යය මතුකිරීම සඳහා දහ අට සන්නියේ භාවිත කර ඇති නාට්‍යමය උපක්‍රම මොනවාදැයි විවරණය කරන්න. (ලකුණු 20)

03. බෞද්ධාගමික වත් පිළිවෙත්වල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ මොනවාදැයි නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 20)

04. ''සොකරි නාටකය ඊට ම අනන්‍ය වූ රංග ශෛලියකින් යුක්තය.'' මෙම ප්‍රකාශය නිදසුන් දක්වමින් සනාථ කරන්න. (ලකුණු 20)

05. අ) කෝලම් රංග භූමියේ රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න. (ලකුණු 08)

ආ) කෝලම් රංග ශෛලියෙහි දක්නට ලැබෙන විශේෂතා මොනවාදැයි නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

06. අ) නාඩගමෙහි රංග ශෛලිය නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

ආ) නාඩගම පිරිහීමට බලපෑ හේතු සාධක සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. ගුරුහාමි
2. ජස කෝලම
3. සෙල්ලම් ළමා
4. මනමේ කෝලම

(ලකුණු 10x2=20)

***************************